අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026
General Certificate of Education ( Adv. Level ) Examination - 2026

උපකාරක තක්සේරුව
உதவி மதிப்பீடு
Supportive Assessment

සිංහල මාධ්‍යය

# ශ්‍රී ලංකා ඉතිහාසය

## History of Sri Lanka - இலங்கை வரலாறு



Question Paper – I-II ප්‍රශ්න පත්‍රය – I-II

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education
National Languages and Humanities Branch

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education. Higher Education and Vocational Education

25 | S | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

**ශ්‍රී ලංකා ඉතිහාසය I (I කොටස)**
இலங்கை வரலாறு I (பகுதி I)
History of Sri Lanka I (Part I)

පැය තුනයි
மணி மூன்று ஆகுது
*Three hours*

**අමතර කියවීම් කාලය – මිනිත්තු 10 යි**
**தல் வாசிப்பு நேரம் – 10 நிமிடங்கள்**
**Additional Reading Time – 10 Minutes**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව.1978 දක්වා

විභාග අංකය -.......................................................

## උපදෙස්-

- මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.
- **I** කොටසෙහි 1 – 40 දක්වා ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම **ලබා දී ඇති** උපදෙස් පරිදි පිළිතුරු සපයන්න.
- **I** කොටසෙහි නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
- කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි**. පිළිතුරු ලියා අවසන් වූ පසු **I** කොටස **II** කොටසේ පිළිතුරු පත්‍රය සමඟ **අමුණා භාර දෙන්න.**

**I** කොටස

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත .ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ** .එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න .

1. (1) සුලයිමන් (2) අබුසයිද් (3) අල්බිරූනි (4) මසූදි (5) ස්ට්‍රාබෝ (.....)

2. (1) කාසිමොටෙයි ලිපිය (2) තම්මැන්නාව ලිපිය (3) කුරුණෑගල ගලඋඩ ලිපිය (4) මණ්ඩගල ලිපිය (5) හැබැස්ස ලිපිය (.....)

3. (1) පාහියන්ගල (2) රංචාමඩම (3) යටිගල්පොත්ත (4) හල්දුම්මුල්ල (5) බෙරගල (.....)

4. (1) උත්තිය (2) වළගම්බා (3) මහාසිව (4) සූරතිස්ස (5) අසේල (.....)

5. (1) චෛතියසරය (2) පටිමාසර (3) බෝධිසර (4) රාජසභා මණ්ඩප (5) පධානසර (.....)

6. (1) කෝට්ටේ (2) ගම්පොළ (3) යාපහුව (4) කුරුණෑගල (5) දඹදෙණිය (.....)

7. (1) රොබට් බ්‍රවුන්රිග් (2) පෙඩ්රික් නෝර්ත් (3) දියෝගුද මේලෝ (4) තෝමස් මේට්ලන්ඩ් (5) වයිකවුන්ට් ටොරින්ටන් (.....)

8. (1) පොල්ගස් බද්ද (2) ඇ බද්ද (3) ලුණුබද්ද (4) මාළු බද්ද (5) රා-අරක්කු බද්ද (.....)

9. (1) කැප්පෙටිපොළ (2) මඩුගල්ලේ (3) ඇහැලේපොළ
(4) කිවුලේගෙදර (5)හඟුරන්කෙත ඩිංගිරාල (.....)

10. (1) කෝපි (2) තේ (3) කොකෝවා
(4) කරදමුංගු (5) සාදික්කා (.....)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත .ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ** .එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න .

11. (1) ඇරිස්ටෝටල් - ඩිමුන්ඩෝ
(2) මෙගස්තිනිස් - ඉන්ඩිකා
(3) ටොලමි - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය
(4) කොස්මස් - නැවුරාලිස් හිස්ටෝරියා
(5) ප්‍රොකෝපියස් - පර්සියානු යුද්ධය (.....)

12. (1) කුමාරදාස රජු - ජානකීහරණය
(2) හතරවන සේන රජු - සියබස්ලකර
(3) පස්වන කාශ්‍යප රජු - දම්පියා අටුවා ගැටපදය
(4) දෙවන පැරකුම් රජු - පූජාවලිය
(5) හයවන පැරකුම් රජු - රුවන්මල් නිඝණ්ඩුව (.....)

13. (1) අනුරාධපුරය - සත් ද්‍රවිඩ ආක්‍රමණය
(2) පොළොන්නරුව - මාඝගේ ආක්‍රමණය
(3) දඹදෙණිය - චන්ද්‍රභානුගේ ආක්‍රමණය
(4) කුරුණෑගල - බෝදා මාපාණගේ කැරැල්ල
(5) ගම්පොළ - ජෝතිය සිටානන්ගේ කැරැල්ල (.....)

14. (1) එරබත්තොට - සුන්භාත පිරිවෙන
(2) වීදාගම - ශ්‍රී සනානන්ද පිරිවෙන
(3) තොටගමුවේ - විජයබා පිරිවෙන
(4) පැපිලියානේ - සුනේත්‍රාදේවී පිරිවෙන
(5) කැරගල - පද්මාවතී පිරිවෙන (.....)

15. (1) කොනප්පු බණ්ඩාර - පළමුවන විමලධර්මසූරිය
(2) ටිකිරි කුමරු - පළමුවන රාජසිංහ
(3) මහාඅස්ථාන කුමරු - දෙවන රාජසිංහ
(4) චක්‍රායුධ කුමරු - හයවන විජයබාහු
(5) අම්බුළුගල කුමරු - හත්වන බුවනෙකබාහු (.....)

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම /ප්‍රකාශන /දින වකවානු සමූහයක් X හා **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම /ප්‍රකාශන /දින වකවානු X තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ.** Y තීරය, X තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය තෝරා වරහන තුළ** ලියන්න.

16.

| | X | Y |
|---|---|---|
| (i) | රන් සන්නස | A හෝපිටිගම |
| (ii) | තඹ සන්නස | B වල්ලිපුරම් |
| (iii) | ටැම් ලිපිය | C මිහින්තලා |
| (iv) | පුවරු ලිපිය | D පනාකඩුව |
| (v) | ගිරි ලිපිය | E තෝණිගල |

(1) ABDCE (2) ACBDE (3) BDACE (4) CEBDA (5) DEABC (.....)

17.

| | X | Y |
|---|---|---|
| (i) | I විජයබාහු | A තිලෝක සුන්දරී |
| (ii) | මානාභරණ | B ලෝකනාතා |
| (iii) | කිත්සිරිමේඝ | C රත්නාවලී |
| (iv) | සිරිවල්ලභ | D රූපවතී |
| (v) | I පරාක්‍රමබාහු | E සුගලා |

(1) ABDEC (2) ACBED (3) BADCE (4) DEBCA (5) ECBAD (.....)

18.

| | X | Y |
|---|---|---|
| (i) | කාව්‍යශේඛරය | A ශ්‍රී රාමචන්ද්‍ර භාරතී |
| (ii) | ලෝවැඩ සඟරාව | B වැත්තැවේ හිමි |
| (iii) | ගුත්තිල කාව්‍ය | C තොටගමුවේ රාහුල හිමි |
| (iv) | ලෝකෝපකාරය | D රණස්ගල්ලේ හිමි |
| (v) | භක්ති ශතකය | E වීදාගම මහා මෛත්‍රිය හිමි |

(1) ABCDE (2) AEBDC (3) CAEBD (4) CEBDA (5) ECABD (.....)

19.

| | X | Y |
|---|---|---|
| (i) | සිබෙල්ට් ද වර්ට් | A පළමුවන විමලධර්මසූරිය රජතුමා |
| (ii) | ජෝන් පයිබස් | B කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා |
| (iii) | මැක්ඩෝවල් | C රාජාධි රාජසිංහ රජතුමා |
| (iv) | හියු බොයිඩ් | D ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා |
| (v) | ජෙරාඩ් හල්ෆ්ට් | E දෙවන රාජසිංහ රජතුමා |

(1) ABDCE (2) ADBCE (3) CDABE (4) CEBDA (5) DAEBC (.....)

20.

| | X | Y |
|---|---|---|
| (i) | 1947 මහමැතිවරණය | A ඩඩ්ලි සේනානායක මහතා |
| (ii) | 1952 මහමැතිවරණය | B සිරිමා බණ්ඩාරනායක මැතිණිය |
| (iii) | 1956 මහමැතිවරණය | C ජේ.ආර්. ජයවර්ධන මහතා |
| (iv) | 1960 ජූලි මහමැතිවරණය | D ඩී.එස්.සේනානායක මහතා |
| (v) | 1977 මහමැතිවරණය | E එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා |

(1) ABDEC (2) ACBDE (3) DAEBC (4) DAECB (5) DCAEB (.....)

- අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. **මධ්‍ය ශිලා යුගය හා ජනාවාස**
(1) අදින් වසර 40000 පෙර ආරම්භ වීම.
(2) ආහාර හා ජලය ලබාගැනීමේ පහසුව මත ජනාවාස සඳහා ප්‍රදේශ තෝරාගෙන ඇත.
(3) මෙම යුගයේ මානවයා පොදුවේ බලංගොඩ මානවයා ලෙස හැඳින්වේ.
(4) ස්වභාවික ගල් ලෙන් හා එළිමහන් ස්ථාන ජනාවාස ලෙස තෝරා ගැනීම.
(5) ලංකාවේ වියළි කලාපයේ පමණක් ජනාවාස ව්‍යාප්තව තිබීම. (.....)

22. **පළමුවෙනි විජයබාහු රජුගේ කාර්යසාඵල්‍ය**
(1) රජරට ප්‍රදේශය චෝළ ආධිපත්‍යයෙන් මුදවා ගැනීම.
(2) පොළොන්නරුව අගනගරය කර ගැනීම.
(3) හල්ලුකගේ ආක්‍රමණය මර්දනය කිරීම.
(4) බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන්වා නැවත ශාසනය පිහිටුවීම.
(5) අනුරාධපුරයේ පැවති පැරණි පාලනතන්ත්‍රය නැවත ගොඩනැගීම. (.....)

23. අලකේශ්වර පරපුර
(1) ඉන්දියාවේ කේරල ප්‍රදේශයේ වංචි පුරයේ සිට පැමිණි පිරිසක් වීම.
(2) රයිගම මූලස්ථානය කරගන පාලනය මෙහෙය වීම.
(3) නිශ්ශංක අලගක්කෝනාර තුන්වන වික්‍රමබාහු රජුගේ අග්‍රමන්ත්‍රීවරයා වීම.
(4) චෙන්හෝ සෙනවිවරයා විසින් නිශ්ශංක අලකේශ්වර සිරකරුවෙකු ලෙස චීනයට රැගෙන යාම.
(5) නිශ්ශංක අලගක්කෝනාර විසින් කෝට්ටේ බලකොටුව ඉදි කිරීම. (.....)

24. කෝල්බෘක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණ
(1) අනිවාර්යසේවා රාජකාරි ක්‍රමය ස්ථාපිත කිරීම.
(2) රජයේ වෙළෙඳ ඒකාධිකාරිය අහෝසි කිරීම.
(3) රජයේ ඉඩම් විකිණීමට අවස්ථාව ලබා දීම.
(4) පෞද්ගලික ව්‍යාවසායකයින් දිරිගැන්වීම.
(5) රජයේ වියදම් අඩුකිරීමට පියවර ගැනීම. (.....)

25. ක්‍රි.ව 1818 නිදහස් සටන
(1) මොල්ලිගොඩ හා එක්නැලිගොඩ ඉංග්‍රීසීන්ට සහය වීම.
(2) දොරේසාමි නම් පුද්ගලයෙකු රජු වශයෙන් ඉදිරිපත් වීම.
(3) මාතලේ ප්‍රදේශයෙන් ආරම්භ වීම.
(4) සටන මනාලෙස සංවිධානය වී නොතිබීම.
(5) කැප්පෙටිපොළ සිංහල කැරලි කරුවන්ට සහය ලබා දීම. (.....)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A),(B),(C) සහ (D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් .................................................. 1 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් .................................................. 2 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් .................................................. 3 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් .................................................. 4 ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් .......... **5 ද, වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

26. දීපවංසය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) දැනට ඉතිරි වී ඇති ලංකාවේ පැරණිතම වංසකතාවයි.
(B) ක්‍රි.ව 5-6 සියවස් අතර කාලයේ දී රචනා කර ඇත.
(C) බුද්ධ කාලයේ සිට මහසෙන් රාජ්‍ය සමය අවසානය දක්වා තොරතුරු සඳහන්ව ඇත.
(D) ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය හැදෑරීමේ දී වැදගත්ම මූලාශ්‍රයයි. (.....)

27. පණ්ඩුකාභය රජතුමා සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ආර්යය සම්භවයකින් යුතු අයෙක් වීම.
(B) යක්ෂ ගෝත්‍රික ජන කණ්ඩායම්වල සහය ලබා ගැනීම.
(C) මහා මේඝ උයන කරවීම.
(D) උපතිස්ස ග්‍රාමය පාලන මධ්‍යස්ථානය කර ගැනීම. (.....)

28. යාපනය රාජධානිය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) පොළොන්නරුව රාජධානි සමයේ සිට ම යාපනය ස්වාධීන පාලන මධ්‍යස්ථානයක් වීම.
   (B) ආර්ය චක්‍රවර්ති පාලකයන් විසින් යාපන ප්‍රදේශය පාලනය කිරීම.
   (C) සපුමල් කුමරු විසින් යාපන ප්‍රදේශය කෝට්ටේ රාජධානියට යටත් කරගැනීම.
   (D) පෘතුගීසීන්හට යාපන රාජධානිය යටත් කරගැනීමට නොහැකි විම. (.....)

29. මිශනාරි ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) ආගම ප්‍රචාරය සඳහා අධ්‍යාපනය, ලේඛනය හා දේශනය යොදා ගැනීම.
   (B) සාම්ප්‍රදායික ආගමිකයන් හට බාධාවක් නොවන අයුරින් ක්‍රියාත්මක වීම.
   (C) ක්‍රිස්තු භක්තිකයන්ට හා රෝමානුක කතෝලිකයන්ට විශේෂ වරප්‍රසාද ලබා දීම.
   (D) පිරිවෙන් සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම. (.....)

30. පළමු ජනරජ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ලෙස හැඳින්වීම.
   (B) විධායක ජනාධිපති ධූරය හඳුන්වා දීම.
   (C) ජාතික රාජ්‍ය සභාව පිහිටුවීම.
   (D) සෙනෙට් සභාව අහෝසි කිරීම. (.....)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31. මාර්කෝ පෝලෝ නම් ඉතාලි ජාතික දේශ ගවේෂකයා ශ්‍රී ලංකාවට පැමිණියේ කුමන යුගයේ ද ?
   (1) දඹදෙණිය (2) යාපහුව (3) කුරුණෑගල
   (4) ගම්පොළ (5) කෝට්ටේ (.....)

32. උතුරු ඉන්දියාවේ සමුද්‍ර ගුප්ත රජු සමග සබඳතා පැවැත් වූ පාලකයා කවරෙක් ද?
   (1) සිරිමේඝවර්ණ (2) ධාතුසේන (3) වසභ
   (4) දෙවෙනි සේන (5) මානවම්ම (.....)

33. අඹන්වෙල රාළගේ නායකත්වයෙන් ඇති වූ කැරැල්ලට මුහුණ දීමට සිදුවූ උඩරට පාලකයා කවරෙක් ද?
   (1) සෙනරත් රජු (2) දෙවන රාජසිංහ රජු (3) කීර්ති ශ්‍රී රාජසිංහ රජු
   (4) ශ්‍රී විජය රාජසිංහ රජු (5) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (.....)

34. දුම්කොළ වෙළඳාම රජයේ ඒකාධිකාරයක් බවට පත්කළ ආණ්ඩුකාරවරයා කවරෙක් ද?
   (1) පෙඩ්රික් නෝර්ත් (2) තෝමස් මේට්ලන්ඩ් (3) වයිකවුන්ට් ටොරින්ටන්
   (4) ස්ටුවට් මැකන්සි (5) රොබට් බ්‍රවුන්රිග් (.....)

35. විද්‍යාලංකාර පිරිවෙන මුල් කරගනිමින් බිහිවූ විශ්වවිද්‍යාලය කුමක් ද?
   (1) කොළඹ (2) පේරාදෙණිය (3) කැලණිය
   (4) ජයවර්ධනපුර (5) මොරටුව (.....)

- පහත **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1,2,3,4 සහ 5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| 36 | විජය කුමරු ඇතුළු හත්සියයක් පිරිස ලංකාවට පැමිණ ජනාවාස පිහිටුවා ගන්නා ලදි. | එසේ පිහිටුවාගත් මුල්ම ආර්ය ජනාවාස වියළි කලාපයේ මල්වතු හා කලාඔය ආදී ගංගා නිම්න ඇසුරු කරගෙන බිහි විය. | (.....) |
| 37 | ලංකාවට පැමිණි මුල්ම විදේශීය ආක්‍රමණය ලෙස සැලකෙන්නේ සේන ගුත්තිකගේ ආක්‍රමණය යි. | චෝළ ආක්‍රමණ නිසා අනුරාධපුර රාජධානියේ බිඳ වැටීම සිදු විය. | (.....) |
| 38 | ගල්ඔය ලංකාවේ පළමු බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය යි. | ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් මහවැලි සංවර්ධන යෝජනාක්‍රමය ආරම්භ කරන ලදි. | (.....) |
| 39 | කෝල්බෲක්-කැමරන් ආණ්ඩු ක්‍රමය මගින් ලංකාවට සර්වජන ඡන්ද බලය හිමි විය. | වර්තමාන ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය රෝම ලන්දේසි නීතිය පදනම් කරගෙන බිහි වී ඇත. | (.....) |
| 40 | 1818 උඩරට ප්‍රකාශය මගින් රදළ ප්‍රධානීන්ගේ අයිතිවාසිකම් හා බලතල ආරක්ෂා කරන ලදි. | ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසින් බෝගම්බර වැව ඉදිකරවන ලදි. | (.....) |

***

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

25 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

**ශ්‍රී ලංකා ඉතිහාසය I (II කොටස)**
**இலங்கை வரலாறு I (பகுதி II)**
**History of Sri Lanka I (Part II)**

ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව.1978 දක්වා

උපදෙස්-
- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි**.
- II කොටස **A,B හා C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
  (**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ **දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන** ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) යාන් ඔය | (ii) දෙවුන්දර | (iii) ඉරණමඩු ජලාශය | (iv) මඩකලපුව |
| (v) කල්පිටිය | (vi) ගාල්ල | (vii) රයිගම | (viii) ගන්නෝරුව |
| (ix) කිරිදි ඔය | (x) මාතලේ | (xi) බස්නාහිර පළාත | (xii) නල්ලූර් |

( නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)

## B කොටස

2. ලංකා ඉතිහාසය අධ්‍යයනය කිරීමෙහිලා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වැදගත්කම සාකච්ඡා කරන්න. ( ලකුණු 16 යි )

3. "දුටුගැමුණු රජුගේ ජයග්‍රහණයට මහ හෙළිකර දුන්නේ කාවන්තිස්ස රජුය ".
   (i) කාවන්තිස්ස රජුගේ පාලන මධ්‍යස්ථානය නම් කරන්න. ( ලකුණු 01 යි )
   (ii) කාවන්තිස්ස රජුගේ අගමෙහෙසිය නම් කරන්න. ( ලකුණු 01 යි )
   (iii) රෝහණ රාජවංශයේ පාලකයන් විසින් ඉදිකරන ලද දාගැබ් **දෙකක්** නම් කරන්න. ( ලකුණු 02 යි )
   (iv) ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. ( ලකුණු 12 යි )

4. රජරට ශිෂ්ටාචාරයේ ආර්ථිකය හැඩගැසුණු ආකාරය පහත ශීර්ෂ යටතේ විස්තර කරන්න.
   (i) කෘෂිකර්මාන්තය
   (ii) කර්මාන්ත
   (iii) වෙළෙඳාම ( ලකුණු 16 යි )

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   (i) මලය රට
   (ii) දේවානම්පියතිස්ස රජතුමා
   (iii) යාපහුව රාජධානිය
   (iv) දඹදෙණි යුගයේ අධ්‍යාපනික හා සංස්කෘතික දියුණුව (ලකුණු 08x2 = 16 යි)

## C කොටස

6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි හා ලන්දේසි පාලනයේ කැපී පෙනෙන ලක්ෂණ පහත දැක්වෙන ක්ෂේත්‍ර ඔස්සේ සංසන්දනාත්මකව පැහැදිලි කරන්න.
   I. ආර්ථික ප්‍රතිපත්තිය
   II. ආගමික ප්‍රතිපත්තිය ( ලකුණු 16 යි )

7. ක්‍රි.ව.1848 නිදහස් අරගලයේ ඓතිහාසික පසුබිම, එම නිදහස් අරගලයට බලපෑ හේතු, සටනේ නායකයින් හා එහි ප්‍රතිඵල ඇසුරෙන් විස්තර කරන්න. ( ලකුණු 16 යි )

8. "ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ඉතිහාසයේ සුවිශේෂී අවස්තාවක් ලෙස ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වා දිය හැකිය".
   i. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන් අවදියේ මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර ධූරය දරන ලද්දේ කවුරුන් ද? ( ලකුණු 01 යි )
   ii. ඩොනමෝර් කොමිසමේ සාමාජිකයන් දෙදෙනෙකු නම් කරන්න. ( ලකුණු 02 යි )
   iii. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හඳුන්වා දීමට පෙර පැවති මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ දැකිය හැකි ලක්ෂණ ගෙනහැර දක්වන්න. ( ලකුණු 04 යි )
   iv. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපීපෙනෙන ලක්ෂණ විස්තර කරන්න. ( ලකුණු 09 යි )

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

   (i) මහනුවර යුගයේ සමාජ සංවිධානය
   (ii) ලංකා ජාතික සංගමය
   (iii) බ්‍රිතාන්‍ය වෙළෙඳ සමාගම යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ පාලනය
   (iv) මහවැලි සංවර්ධන යෝජනාක්‍රමය ( ලකුණු 08x2 = 16 යි )

***

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
**கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**
**Minister of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

**ශ්‍රී ලංකා ඉතිහාසය | (II කොටස)**
**இலங்கை வரலாறு | (பகுதி II)**
**History of Sri Lanka | (Part II)**

ප්‍රශ්න අංකය - ........

විභාග අංකය - .....................................



අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026
General Certificate of Education ( Adv. Level ) Examination - 2026

උපකාරක තක්සේරුව - පිළිතුරු පත්‍රය
உதவி மதிப்பீடு - விடைப்பத்திரம
Supportive Assessment - Answer sheet

සිංහල මාධ්‍යය

# ශ්‍රී ලංකා ඉතිහාසය

## History of Sri Lanka - இலங்கை வரலாறு



**පිළිතුරු පත්‍රය - I,II Answer Paper – I ,II**

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education
National Languages and Humanities Branch

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

# 25- ඉතිහාසය

## ලකුණු බෙදී යාම

| | | |
|---|---|---|
| I පත්‍රය | 01 x 40 | = 40 |
| II පත්‍රය | | |
| | අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = 12 |
| | සෙසු ප්‍රශ්න 03 කට 16 බැගින් | = 48 |
| | II පත්‍රයේ අවසාන ලකුණු | = 60 |
| | **අවසාන ලකුණු** | **= 40 +60 = 100** |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026


විෂයය අංකය / பாட இலக்கம் **25** විෂයය / பாடம் **ශ්‍රී ලංකා ඉතිහාසය**

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 5 | 11 | 4 | 21 | 5 | 31 | 2 |
| 02 | 4 | 12 | 4 | 22 | 3 | 32 | 1 |
| 03 | 1 | 13 | 5 | 23 | 4 | 33 | 2 |
| 04 | 2 | 14 | 1 | 24 | 1 | 34 | 5 |
| 05 | 4 | 15 | 5 | 25 | 3 | 35 | 3 |
| 06 | 2 | 16 | 3 | 26 | 2 | 36 | 5 |
| 07 | 3 | 17 | 2 | 27 | 1 | 37 | 2 |
| 08 | 2 | 18 | 4 | 28 | 3 | 38 | 1 |
| 09 | 5 | 19 | 1 | 29 | 2 | 39 | 4 |
| 10 | 2 | 20 | 3 | 30 | 4 | 40 | 3 |

විශේෂ උපදෙස් -
එක් පිළිතුරකට ලකුණු 1 බැගින් - 1 x 40 = 40

ප්‍රශ්න අංක 01



අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

25 | S | II

| | |
|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | I (II කොටස) |
| இலங்கை வரலாறு | I (பகுதி II) |
| History of Sri Lanka | I (Part II) |

ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව.1978 දක්වා

උපදෙස්-
- ❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- ❖ II කොටස A,B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- ❖ A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
  (පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස සමග සපයා ඇත)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) යාන් ඔය | (ii) දෙවුන්දර | (iii) ඉරණමඩු ජලාශය | (iv) මඩකලපුව |
| (v) කල්පිටිය | (vi) ගාල්ල | (vii) රයිගම | (viii) ගන්නෝරුව |
| (ix) කිරිඳි ඔය | (x) මාතලේ | (xi) බස්නාහිර පළාත | (xii) නල්ලූර් |

( නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)

## B කොටස

**2. ලංකා ඉතිහාසය අධ්‍යයනය කිරීමෙහිලා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වැදගත්කම සාකච්ජා කරන්න.**

- අභිලේඛන, කාසි, නටබුන්, චිත්‍ර, මූර්ති, කැටයම් හා පුරාවස්තු යන ඒවා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස සලකනු ලැබේ.
- අභිලේඛන
  - අභිලේඛන යනු සෙල්ලිපි, රන්පත්, තඹපත්, කුරුටු ගී යනාදියයි. අදාළ ඓතිහාසික සිද්ධි වලට ආසන්න කාල වලදී නිර්මාණය වීමත් සාහිත්‍ය මූලාශ්‍ර වලට සාපේක්ෂව අතිශෝක්තිය අඩු වීමත් නිත්‍ය කරුණු වාර්තා කර තිබීමත් නිසාම මේවා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අතුරින් වඩාත් විශ්වසනීය මූලාශ්‍ර වර්ගය සේ සැලකේ.
  - වංසකතාවල අඩංගු සාවද්‍ය තැන් නිවැරදි කරගැනීම හා අතිරේක තොරතුරු ලබා ගැනීම සඳහා අභිලේඛන පිටුබලයක් වේ.
  - සාහිත්‍ය මූලාශ්‍රවල එතරම් තොරතුරු හමු නොවන ආර්ථික අංශය පිළිබඳව තොරතුරු රැසක් සෙල්ලිපිවලින් හමුවේ.
    ගොඩවාය ලිපිය - බදු
    බදුලු ටැම් ලිපිය - වෙළඳ බදු සහ වෙළඳ ද්‍රව්‍ය, රාජ්‍ය නිලධාරීන්ගේ අක්‍රමිකතා
    තෝනිගල සෙල්ලිපිය - සමකාලීන බැංකු ක්‍රමය, පොලිය හා වෙළඳ ශ්‍රේණි
    දෙවනගල සෙල්ලිපිය - විදේශ වෙළඳාම, විදේශ ආක්‍රමණ, සේවා අගය කිරීම
    තිරියාය ලිපිය - වෙළඳාම
    බදු වර්ග - දකපති. බොජකපති ආදී
  - විවිධ හිමිකම්, නිලනාම, දේපළ හිමිකම, දේපළ පැවරීම ආදිය පිළිබඳ තොරතුරු.
  - විවිධ වෘත්තිකයන් පිලිබඳ තොරතුරු.
  - ආගමික ආයතන වලට කරන ලද පරිත්‍යාග හා ඊට අදාළ නීතිරීති.
  - ස්ථාන නිවැරදිව හඳුනාගත හැකිවීම - නකදිව (නාගදීපය), කාජරගාම (කතරගම)
    භාෂා පරිණාමය සහ අක්ෂර විකාශය වැනි අංශ පිළිබඳ තොරතුරු ලබාගත හැකි වීම.
  - කෙසේ වෙතත් අභිලේඛන වලින් පමණක් සවිස්තර කාලනිර්ණයානුකූල ඉතිහාසයක් ගොඩනගා ගැනීම දුෂ්කර වේ.
- පුරා වස්තු හා නටබුන්

- පූර්ව ඓතිහාසික යුගයට අයත් පොසිල, ක්ෂුද්‍ර ගල් ආයුධ ආදී දෑ සහ තත් කාලයට අයත් අස්ථි, පබලු හා වළං ආදී දෑ මගින් මානවයා පිළිබඳ තොරතුරු රැසක් හෙළිවේ.
- වැව් හා ඇළ මාර්ග නටබුන් මගින් තාක්ෂණය හා ජීවන රටාව පිළිබඳ තොරතුරු හෙළි වේ.
- පුරාණ රෝහල් හා සම්බන්ධ නටබුන් වලින් හා පුරාවස්තු වලින් සෞඛ්‍යය හා ස්වස්ථතාව පිළිබඳ තොරතුරු අනාවරණ වේ.
- තත්කාලීන වාස්තු විද්‍යාව පිළිබඳ දාගැබ් හා ගොඩනැගිලි මගින් හෙළිවන තොරතුරු.
- සීගිරිය වැනි ස්ථාන වලින් හමුවන නටබුන් මගින් නගර නිර්මාණය හා ආරක්ෂාව ආදී අංග පිළිබඳව තොරතුරු හෙළිවේ.
- ආගමික හා ලෞකික ජීවිතය. විදේශ බලපෑම හා තාක්ෂණය ආදී අංශ පිළිබඳව තොරතුරු බොහොමයක් හෙළිවේ.

- චිත්‍ර, මූර්ති හා කැටයම් ආදියෙන් තත්කාලීන කලාව හා කලා රසිකත්වය පිළිබඳ තොරතුරු අනාවරණ වේ.
- නාණක
  - තත්කාලීන ආර්ථිකය පිළිබඳ නිවැරදි තොරතුරු හෙළිකර ගැනීමට උපකාරී වේ විදේශ රටවල් සමග ගනුදෙනු කළ ආකාරය හා කවර රටවල් සමග ගනුදෙනු කළේද යන්න.
  - කාසි නිකුත් කළ පාලකයන්. ඔවුන්ගේ විරුද නාම හා නිකුත් කළ වර්ෂ පිළිබඳ තොරතුරු හමුවේ.
  - කාසි නිෂ්පාදනය කොට ඇති ලෝහ මගින් ආර්ථිකය පිළිබඳ තොරතුරු ලබාගතහැකි වීම හා කාසි නිර්මාණයේ විකාශය මගින් තාක්ෂණයේ වර්ධනය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි වීම.
  - කාසිවල දක්නට ලැබෙන ඇතැම් රූප මගින් තත්කාලීන සමාජයේ ඇදහිලි හා විශ්වාස පිළිබඳ අදහසක් ලබාගත හැකි වීම. ( ලකුණු 16 යි)

3. **"දුටුගැමුණු රජුගේ ජයග්‍රහණයට මහ හෙළිකර දුන්නේ කාවන්තිස්ස රජුය ".**

**(i) කාවන්තිස්ස රජුගේ පාලන මධ්‍යස්ථානය නම් කරන්න.** ( ලකුණු 01 යි)
- **මාගම**

**(ii) කාවන්තිස්ස රජුගේ අගමෙහෙසිය නම්කරන්න.** ( ලකුණු 01 යි)
- **විහාර මහා දේවී**

**(iii) රෝහණ රාජවංශයේ පාලකයන් විසින් ඉදිකරන ලද දාගැබ් දෙකක් නම් කරන්න.** ( ලකුණු 02 යි)
- **තිස්සමහාරාමය, යටාලවෙහෙර, සේරුවාවිල මංගල මහා සෑය**

**(iv) ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.** ( ලකුණු 13 යි)

- කාවන්තිස්ස රජු පිළිබඳවත් දුටුගැමුණු රජුගේ කාර්ය සාඵල්‍යය ගැනත් කරුණු වීම සීමේ දී මහාවංසය සැලකිය යුතු තොරතුරු සමුදායක් ලබාදෙයි. දුටුගැමුණු රජතුමා විසින් ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම සඳහා ගෙන ගිය ක්‍රියා මාර්ගයට කාවන්තිස්ස රජුගෙන් ලැබුණු දායකත්වය ප්‍රමාණ කිරීම සඳහා අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍රය වල තොරතුරුද වැදගත් වේ.
- එක්සත් රාජ්‍යයක් ගොඩනැගීම සඳහා දුටුගැමුණු රජු දියත් කළ යුද ව්‍යාපාරය සාර්ථක කර ගැනීම පිණිස කාවන්තිස්ස රජුගෙන් ප්‍රබල දායකත්වයක් ලැබුණු බව එබඳු මූලාශ්‍රය තුළින් තහවුරු වී ඇත.විවාහ සබඳතා මගින් දකුණේ ප්‍රාදේශීය රාජ්‍ය සමග සබඳතා තර කර ගැනීම .(උදා: කැලණිය හා ගිරි නුවර).
- ආගමික සබඳතා මඟින් නැගෙනහිර කලාපයේ සේරු, ලෝණ හා සෝම පාලන ඒකකවල අවනත බව ලබා ගැනීම.
- භික්ෂූන්ගේ අවවාද අනුශාසනා සිය පුත් කුමාරවරුන්ට ලබාදීමට කටයුතු කිරීම.
- දකුණේ හා නැගෙනහිර ආගමික ස්ථාන දියුණු කරමින් භික්ෂූන්ගේ හා ජනතාවගේ ප්‍රසාදය දිනා ගැනීම.
- එළාරගෙන් එල්ල විය. හැකි තර්ජනයන්ට මුහුණදීම සඳහා ආරක්ෂක විධිවිධාන සැලසීම .
- දස මහා යෝධයන්ගෙන් සමන්විත වූ ශක්තිමත් චතුරංගනී සේනාවක් සංවිධානය කිරීම.
- අවිආයුධ නිෂ්පාදනය හා එක් රැස් කිරීම.
- දුටුගැමුණු - සද්ධාතිස්ස කුමාරවරු අතර ගැටුමක් ඇති වුවහොත් අපක්ෂපාතීව ක්‍රියා කරන බවට හමුදාවෙන් ප්‍රතිඥා ලබාගැනීම.
- සටන් කිරීම සම්බන්ධයෙන් දුටුගැමුණුගේ පැවති ආවේගශීලී අදහස් අවවාද මගින් සමනය කිරීම.
- දීඝාභය කුමරු යොදවා කච්ඡතිත්ථ වැනි ආරක්ෂිතස්ථාන වල ආරක්ෂාව තර කරවීම.
- සද්ධාතිස්ස කුමරු දිගා වැව හෙවත් දීඝවාපී ප්‍රදේශයට යවා එම කලාපය සශ්‍රීක කරවීම.

4. **රජරට ශිෂ්ටාචාරයේ ආර්ථිකය හැඩගැසී තිබූ ආකාරය පහත ශීර්ෂ යටතේ විස්තර කරන්න.**
   1. **කෘෂිකර්මාන්තය**
   2. **කර්මාන්ත**
   3. **වෙළෙඳාම**

(ලකුණු 16 යි)

- කෘෂිකර්මාන්තය:
  - වංස කථා වලට අනුව ක්‍රි.පූ. හයවන සියවසේදී මෙහි පැමිණි විජයගෙන් පසුව මෙරට කෘෂිකර්මාන්තය ආරම්භ වන්නට ඇති බව පිළිගැනේ. එහෙත් අනුරපුර කැණීම්වලට අනුව ක්‍රි. පූ. අටවන සියවසේදීත් වී වගාව පැවති බව වළං කැබලි හා දහයියා සොයා ගෙන තිබීමෙන් තහවුරු වේ.
  - කෘෂිකර්මාන්තය මඩ හා ගොඩ ගොවිතැන (හේන්) වශයෙන් දෙආකාරයකට සිදු කෙරිණි.
  - හතරවන සියවසට අයත් තෝනිගල ලිපියට අනුව කන්න තුනක් (පිට දඩ හස, අකල හස හා මදෙහස) වගාකළ බව පෙනේ.
  - කෘෂිකර්මාන්තයට එල්ල වූ ප්‍රධාන අභියෝග වන වරින්වර හටගත් නියං හා සාගත වලට සාර්ථකව මුහුණ දෙමින් මෙකල කෘෂිකර්මාන්තය වර්ධනය විය.
  - කෘෂිකර්මාන්තය හේතු කොට ගෙන ස්වයංපෝෂිත ආර්ථිකයක් පැවතියේය.ඇතැම් අවස්ථාවල මෙරටින් සහල් අපනයනය කළ බවත් තවත් අවස්ථාවලදී ආනයනය කළ බවත් වාර්තාවල සඳහන් වේ.
  - (ක්‍රි.ව. එකොළොස්වන සියවසේ සිටි අල් ඉද්‍රිසි දකුණු ඉන්දියාවේ ජිර්බටම් වරායෙන් ලංකාවට සහල් ගෙන්වූ බව සඳහන් කර තිබේ.)එහෙත් විදේශ වෙළඳාමේදී සුඛෝපභෝගී වෙළඳ ද්‍රව්‍ය වලට ප්‍රධාන තැන හිමි වී තිබුණු බැවින් සහල් තොග වශයෙන් ගෙනාවේද යන්න සැක සහිතය. සාගත අවස්ථාවල මේවා ගෙන එන්නට ඇතැයි සිතිය හැකිය.
- වෙළෙඳාම:
  - වෙළෙඳාම යනු පැරණි ආර්ථිකයේ එක් ප්‍රධාන අංශයකි. එහෙත් පැරණි මූලාශ්‍ර වල මේ පිළිබඳව එතරම් තොරතුරු සඳහන් නොවේ.
  - වණිජ හෝ වනිව නමින් හැඳින් වූ වෙළෙඳුන් ගැන ක්‍රි.පූ. යුගයේ සිටම මෙරට අභිලේඛනවල සඳහන් වී තිබේ. මුල් බ්‍රාහ්මී ලිපි වලට අනුව පුග හෝ පූගිය නම් වෙළෙඳ සමාගම් හෝ ශ්‍රේණි පැවති බවද පෙනේ.
  - වංශකථාවල සඳහන් වන "සෙට්ඨි " යනු වෙළෙඳ කණ්ඩායමක නායකයෙකි.
- දේශීය වෙළෙඳාම
  - අගනුවර වෙළෙඳාමෙහි කේන්ද්‍රස්ථානය වූයේය.
  - වෙළෙඳ සැල් හා ඒවායෙහි අළෙවි කළ ද්‍රව්‍ය පිළිබඳව සාහිත්‍ය ග්‍රන්ථවල කරුණු සඳහන් වේ.
  - වරාය නගරවල ප්‍රධාන කාර්යය වෙළඳාම වූයේය. රට අභ්‍යන්තරයේ සිට මැණික්, කුළු බඩු සහ අලි ඇතුන් වැනි දෑ මෙම වරාය නගර වලට රැගෙන එන ලදි. වැලිගම, දෙවුන්දර, මහාතිත්ථ හා ගෝකණ්ණ වැනි වරායන් අසල ආගමික මධ්‍යස්ථානද පිහිටියේය.
  - මහාතිත්ථ වරායෙහි වූ මධ්‍යස්ථානයෙහි වෙළෙඳ ශ්‍රේණි විසින් බැංකු පහසුකම් ද සැපයූ අතර ඒවායෙහි මුදල් හෝ ධාන්‍ය තැන්පත් කර වාර්ෂික පොළියක් ලබාගත හැකිවිණි.
  - රට තුළ නිගම හෝ නියම්ගම් නම් වෙළඳ නගර රැසක් පැවතුණි.
  - දහ වන සියවසේ සිටි හතර වන උදය රජුගේ කාලයට අයත් වන බදුලු ටැම් ලිපියේ හෝපිටිගම වෙළෙඳ නගරයක් ගැන කියැවේ.
  - දෙවන සියවසේදී ගොඩවාය වරායේ බදු ආරාමයකට පූජා කොට තිබේ.
  - නව වන සියවසේදී මහප්තු ලද්දන් මහාතිත්ථයෙහි බදු අය කළ නිළධාරියෝ වූහ. දහ වන සියවසේදී හෝපිටිගම වෙළෙඳ පළේ " පඬි ලද් දඩ නායක " එම කාර්යය ඉටු කළේය; වාහල්කඩ දෙමළ සෙල්ලිපියේ " බදු දොරටුවේ ප්‍රධානියෙකු" ගැන සඳහන් වේ.
  - විවිධ කාසි වර්ග භාවිත විය.
  - දහ වන සියවසේ සිට මුතු, මැණික්, අලි ඇතුන් වැනි ද්‍රව්‍ය රජු ඒකාධිකාරය යටතේ පැවතුණි.
- විදේශ වෙළඳාම
  - ජාත්‍යන්තර වෙළෙඳ මාර්ගයකට ආසන්නව පිහිටා තිබීමත්, දිවයිනේ විවිධ ප්‍රදේශ වල පිහිටි ස්වභාවික වරායන් රැසක් නිසාත් ලංකාව අතීතයේ සිටම වැදගත් වෙළෙඳ මධ්‍යස්ථානයක් බවට පත් වී තිබුණි.
  - ලංකාව ජනාවාස වීමේදී පවා වෙළෙඳුන් විශාල මෙහෙයක් ඉටු කරන ලද බව ඇතැම් විදේශීය වාර්තා වලට අනුව (ෆාහියන්, හියුං සාං) තහවුරු වේ.
  - ක්‍රි.පූ. හතර වන සියවසේ සිට ලංකාවෙන් ඉන්දියාවට රැගෙන ගිය භාණ්ඩ එහි සිට ග්‍රීසියට හා රෝමයට රැගෙන ගිය බව දක්නට ලැබේ.
  - ක්‍රි. පූ. පළමු වන හා තෙවන සියවස්වලදී දකුණු ඉන්දීය අරිකමේහි රෝම අවශ්‍යතා සපුරන ලද වෙළෙඳ මධ්‍යස්ථානයක් විය. ලංකාවෙන් ඇත් දත්, මුතු, මැණික්, කැස්බෑ ලෙලි එහි යැවිණි.
  - රෝම රන් කාසි රැසක් මහාතිත්ථ, අනුරාධපුර, මිහින්තලේ, සීගිරිය, වාලච්චේන, කන්තරෝඩය වැනි තැන්වලින් හමු වී තිබේ.

- දකුණු ඉන්දියාවේ අසිත පත්තිවල පදිංචි වූ ලාංකික වෙළෙඳුන් ඉන්දියන් සාගරයේ නාවික කටයුතුවල නියලුණු බව රෝම ලේඛක ප්ලිනි විසින් සඳහන් කොට තිබේ. රෝම අධි රජු සමග සබඳතා පැවැත් වූ ලාංකික රජෙකු ගැනද ඔහු වාර්තා කර තිබේ.
- ක්‍රි.පූ. පළමු වන සියවසේදී භාතිකාභය රජු ද රෝම භාණ්ඩ මෙරටට ගෙන්වා තිබේ.
- මධ්‍ය ආසියාවේ වූ තත්ත්වය නිසා ගොඩබිම් මාර්ග වෙනුවට මුහුදු මාර්ග කෙරෙහි පර්සියන්වරු අවධානය යොමු වූ අවධියේ දකුණු ඉන්දීය හා ලාංකේය වරායන් පෙරටත් වඩා ජනප්‍රිය විය. වෙළෙඳාමේදි ලංකාවට එකල හිමි වූ ස්ථානය කොස්මස්ගේ වාර්තාවෙන් පැහැදිලි වේ.
- ලංකාවේ වරාය වලින් ලබාගත් චීන සේද රෙදි පර්සියානු වෙළෙඳුන් ගෙන් රෝම ජනයා සපයා ගත් බව ප්‍රකොපියස් සඳහන් කර තිබේ.
- චීන මැටි බඳුන් හා කාසි විශාල ප්‍රමාණයක්ද මෙරටින් හමු වී තිබේ.
- දහ වන සියවසේ සිට මුස්ලිම් වෙළඳුන් මෙරට පදංචිව සිටි බව පෙනේ.
- චෝළයින් උතුරු ලංකාවේ බලය ලබා ගැනීමට ප්‍රධාන හේතුව වූයේ ද වෙළෙඳාමයි.

- කර්මාන්ත
  - කුල දහඅටක ශිල්පීන්ගේ පැමිණීම (වංසකථා තොරතුරු)
  - මධුරාපුර කුමරිය (විජායි කුමරිය) සමග විවිධ කර්මාන්තවලට අයත් පිරිස් පැමිණීම,
  - සංඝමිත්තා තෙරණිය සමග 18 කුලයක ශිල්පශ්‍රේණිවලට අයත් පිරිස් පැමිණීම.
  - අභිලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රයවලින් හෙළි වන කර්මාන්ත

<u>අභිලේඛන මූලාශ්‍රය</u>

යකඩ කර්මාන්තය - මුතුගල්ල සෙල්ලිපිය

රන් කර්මාන්තය - මණ්ඩගල සෙල්ලිපිය

ඇත්දත් කර්මාන්තය - වේගිරිය දේවාල සෙල්ලිපිය

ජේෂ කර්මාන්තය - වෙහෙරකෙම සෙල්ලිපිය

<u>සාහිත්‍ය මූලාශ්‍රය</u>

මැටි කර්මාන්තය - කුම්භකාරගාම

මැණික් කර්මාන්තය - මණිකාරගාම

වඩු කර්මාන්තය - වඩ්ඩකීගාම

<u>පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂ</u>

සමනළවැව, අලකොලවැව වැනි ස්ථානවල යකඩ උඳුන් හමුවීම, කුරුණෑගල පබළුගලින් වීදුරු පබළු උඳුන් හමුවීම, අභයගිරිවිහාර පොකුණු ඉවුරේ කැණීම්වලින් රන් උඳුන් හමුවීම.

<u>කර්මාන්ත සහ ඒ සඳහා යොදාගත් උපකරණ</u>

විවිධ කැනීම්වලින් දැකැති, උදලු වැනි උපකරණ හමුවීම, සකපෝරු භාවිතයෙන් තැනූ මැටි බඳුන් හමුවීම.

**5.පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) මලය රට**

- භූගෝලීය බෙදීම්වලට පාදක ස්ථානයක් වීම
- ගිරි දුර්ග, ජල දුර්ග, වන දුර්ග ආදියෙන් ආරක්ෂාව පැවතීම
- මධ්‍ය කඳුකරය මුල් කරගනිමින් බිහි වූ රාජධානි
  උදා : ගම්පොළ, මහනුවර
- මධ්‍ය කඳුකරය නිසා මු`ළු රටෙහි ම දේශපාලන ඒකාබද්ධතාව ඇති කිරීම අපහසු වීම
- විදේශ ආක්‍රමණ හා සිවිල් අරගල ඇතිවූ අවස්ථාවල දී ආරක්ෂක ස්ථානයක් වීම
- ශ්‍රී ලංකාවේ ගංගා පද්ධතියේ පෝෂක ප්‍රදේශය වීම
- මධ්‍ය කඳුකරය පාදක කරගනිමින් බ්‍රිතාන්‍යයන් වතු වගාව ඇරඹීම ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංස්කෘතික පෙරළියකට මුල පිරීම
- අතරමැදි කලාපයේ රබර් වගාව ද, වෙරළබඩ කලාපයේ පොල් වගාව ද ව්‍යාප්ත කිරීම
- අගනුවරට දුරින් පිහිටි මධ්‍ය කඳුකරය ශ්‍රී ලංකාවේ නිදහස් අරගලවල මූලස්ථානය වීම
  උදාහරණ : 1818 ඌව වෙල්ලස්ස නිදහස් සටන

1848 මාතලේ නිදහස් සටන

**(ii) දේවානම්පියතිස්ස රජතුමා**

- අශෝක අධිරාජයා සමඟ පැවැත්වූ සම්බන්ධතා
- අභිෂේකය සඳහා මෞර්ය අධිරාජයාගෙන් රාජ කකුධ භාණ්ඩ ලැබීම
- මෞර්ය අභිෂේක ක්‍රමය මෙරට ස්ථාපිත වීම
- 'දෙවනපිය' විරුද නාමය ලැබීම
- බුද්ධාගම හඳුන්වාදීම සහ රට පුරා එය ව්‍යාප්තවීම
- භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවණක් පිරිස බිහි වීම
- ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කිරීම
- බුදු රජාණන් වහන්සේගේ ධාතු නිදන් කළ චෛත්‍ය ඉදි කිරීම (ථූපාරාමය)
- බුද්ධාගම රාජ්‍ය ආගම බවට පත් වීම
- උපරාජ මහානාග යටතේ මාගම මුල්කොටගත් රෝහණ රාජ්‍යය බිහිවීම

**(iii) යාපහුව රාජධානිය**

- පළමුවෙනි බුවනෙකබාහු රජු (ක්‍රි.ව. 1272 - 1284)
  - ක්‍රි.ව. 1272 දී දඹදෙණියේ රාජත්වයට පත් වී කලක් එහි රාජ්‍ය විචාරා සිය පාලන මධ්‍යස්ථානය බවට යාපහුව තෝරා ගැනීම
  - කදලිවාට, ඇපාණ, තිප, හිමියානක යන නම්වලින් හැඳින්වුණු සිංහල වන්නි ප්‍රධානින්ගෙන් එල්ල වුණු තර්ජනයකට මුහුණ දීමට සිදු වීම
  - කාලිංගරායර හා චෝඩගංග යන අය මෙහෙයවූ දකුණු ඉන්දියානු ආක්‍රමණයකට ද මුහුණ දීමට සිදු වීම
  - විදේශ රටවල් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම
    උදාහරණ: ඊජිප්තුවට යැවූ දූත ගමනක් පිළිබඳ ව අරාබි ලේඛනයක සඳහන් වීම
- පළමුවෙනි බුවනෙකබාහු රජුගෙන් පසු අවධිය
  - පළමුවෙනි බුවනෙකබාහු රජුගේ මරණය ආසන්නයේ හෝ ඉන් අනතුරු ව හෝ ලංකාවේ සාගතයක් ඇති වූ බව වංසකථාවෙහි සඳහන් වීම
  - බුවනෙකබාහු රජුගේ මරණයෙන් පසු ලංකාවේ අරාජක කාලයක් ඇති වූ බව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වීම
  - පාණ්ඩ්‍යයන්ගේ ආධාර ලැබූ ආර්ය චක්‍රවර්තී නම් ද්‍රවිඩ අධිපතියා යාපහුව ආක්‍රමණය කොට දළදාව හා පාත්‍ර ධාතුව පැහැරගෙන ගොස් කුලසේකර නම් පාණ්ඩ්‍ය රජුට භාරදුන් බව සඳහන් වේ.
  - මෙම අරාජික කාලයෙන් පසු තුන්වෙනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව.1287 - 1293) යාපහුවේ රාජ්‍ය බලය ස්ථාපිත කර ගැනීම
  - වර්ෂ 1292 දී මාර්කෝ පෝලෝ නම් ඉතාලි ජාතික දේශගවේෂකයා ලංකාවට පැමිණීම
  - තුන්වෙනි පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍ය දේශයට ගොස් එහි බොහෝ කලක් වාසය කොට යළි දළදාව හා පාත්‍ර ධාතුව රැගෙන ලංකාවට පැමිණ පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කරගෙන රජ විය.
  - දෙවෙනි බුවනෙකබා රජු (ශ්‍රී නිවාස බුවනෙකබාහු) තෙවෙනි පරාක්‍රමබාහු රජු සිටි පොළොන්නරුව ආක්‍රමණයක් කොට ඔහු නෙරපා දමා යාපහුවේ රාජත්වයට පත් වීම

**(iv) දඹදෙණි යුගයේ අධ්‍යාපනික හා සංස්කෘතික දියුණුව**

- දඹදෙණි සමයේ සංස්කෘතිය.
  - තෙවැනි විජයබාහු (ක්‍රි. ව. 1232-1236) රජුගෙන් දඹදෙණි යුගය ආරම්භ වේ.
  - තෙවැනි විජයබාහු සහ දෙවැනි පරාක්‍රමබාහු රජු දවස සංස්කෘතියේ දියුණුවට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.මෙම යුගය මෙරට ඉතිහාසයේ කැපී පෙනෙන සංස්කෘතික ප්‍රබෝධයක් ඇති වූ අවධියක් වීම.
  - ආගම හා බැඳුනු සංස්කෘතික ප්‍රබෝධය.
  - දළදාව ආරක්ෂා කරමින් පුද පූජා පැවැත්වීම (බෙලිගල තැන්පත් කොට දළදාව ආරක්ෂා කිරීම, දඹදෙණියේ විජයසුන්දරරාමයේ දළදා මැදුරක් ඉදිකිරීම, දළදා පූජා පැවැත්වීම, දළදා පෙරහැර පැවැත්වීම).
  - ශාසන සංශෝධනය හා කතිකාවත් ඇති කිරීම (තෙවන විජයබාහු විසින් කරවතලද කතිකාවත් හා දෙවන පරාක්‍රමබාහු විසින් කරවන ලද දඹදෙණි කතිකාවත්.
  - අනුරාධපුර,පොළොන්නරුව නගර ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළු දිවයිනේ විවිධ ස්ථාන වල වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම (ගම්පොළ, කැළණිය, බෙලිගම, අත්තනගල්ල).
  - රත්නපුර මහා සමන් දේවාලය ඉදි කරවීම.
  - පෙරහැර පැවැත්වීම (ඇසළ පෙරහැර හා බුදු පෙරහැර).
- අධ්‍යාපනික දියුණුව

- තෙවන විජයබාහු රජු ස්වකීය පුත්‍රයන් වන පරාක්‍රමබාහු හා භුවනෙකබාහු කුමාරවරුන්ට මනා අධ්‍යාපනයක් ලබාදීම.
- දෙවන පරාක්‍රමබාහු රජු උගත් පඬිවරයෙකු වශයෙන් ග්‍රන්ථකරණයේ නිරත වීම (කව් සිළුමිණ, වන විනිස සන්නය, විසුද්ධිමග්ග සන්නය) මෙන්ම ඒ නිසාම කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත' යන උපාධි නාමයෙන් හැඳින්වීම.
- පිරිවෙන් ඉදිකරවීම ( දඹදෙණිය විජයසුන්දරාරාමය, කුරුණෑගල මහේන්ද්‍රබෑන පිරිවෙන, වාකිරිගල පිරිවෙන ආදී පිරිවෙන් ශාස්ත්‍රීය මධ්‍යස්ථාන බවට පත් වීම).

- සාහිත්‍ය ප්‍රබෝධය
  - සිංහල, පාලි, සංස්කෘත යන භාෂා වලින් රචිත සාහිත්‍ය කෘති ගණනාවක් බිහිවීම.
  - උගත් ගිහි - පැවිදි පඬිවරු බිහිවීම නිසා විවිධ තේමා අළලා ගද්‍ය හා පද්‍ය ග්‍රන්ථ රැසක් රචනා වීම.
  - බෞද්ධ ග්‍රන්ථ රැසක් ද රචනා කිරීම.
  - සිංහල භාෂාවෙන් සිදත් සඟරාව. සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය. යෝගාර්ණවය, කව් සිළුමිණ
  - පාලි භාෂාවෙන් - හත්ථවනගල්ල විහාර වංසය, සමන්තකූට වර්ණනාව, පයෝග සිද්ධි, භේසජ්ජ මඤ්ජුසාව, රසවාහිණිය, ජිනචරිත.
  - සංස්කෘත භාෂාවෙන් - දෛවඥකාමධෙනුව.

**6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුග්‍රීසි හා ලන්දේසි පාලනයේ කැපී පෙනෙන ලක්ෂණ පහත දැක්වෙන ක්ෂේත්‍ර ඔස්සේ සංසන්දනාත්මකව පැහැදිලි කරන්න.**

I. **ආර්ථික ප්‍රතිපත්තිය**

II. **ආගමික ප්‍රතිපත්තිය** .

- පෘතුගීසීන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය
  - යුරෝපයේ ඉහළ ඉල්ලුමක් පැවති කුළුබඩු ඇතුළු වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීම ප්‍රධාන ආර්ථික අරමුණ වීම
  - ඒ සඳහා අරාබි, චීන, මලබාර් වැනි ආසියානු වෙළෙන්දන් සතු වෙළෙඳ අයිතිය ලබා ගැනීමට ක්‍රියා කිරීම
  - පෘතුගීසි දේශපාලන අධිකාරිය විසින් ආර්ථික කටයුතු මෙහෙයවීම
  - ස්වදේශීය සමාජ ආර්ථික සංස්ථා උපයෝගී කරගැනීම

    උදාහරණ

    ඉඩම් භුක්ති ක්‍රමය, කුල ක්‍රමය, අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය, බදු ක්‍රමය
  - ඇතැම් වෙළෙඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඒකාධිකාරයක් ක්‍රියාත්මක කිරීම (කුරුඳු, අලි ඇතුන්,මැණික්, මුතු)
  - උඩරට රාජ්‍යය සමඟ අභ්‍යන්තර වෙළෙඳාම සිදු කිරීම
  - ආනයන, අපනයන වෙළෙඳාමක් පවත්වාගෙන යාම
  - අන්තර් ආසියාතික වෙළෙඳාමට සම්බන්ධ වීම
- පෘතුගීසීන්ගේ ආගමික ප්‍රතිපත්තිය
  - පෘතුගීසීන් සිය යටත්විජිත ප්‍රතිපත්තියේ එක් ප්‍රධාන අරමුණක් ලෙස රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීම
  - ප්‍රධාන අරමුණු දෙකක් පදනම් කරගෙන ආගමික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
    1. පෘතුගීසි ආණ්ඩුවට පක්ෂපාති රටවැසියන් පිරිසක් ඇති කර ගැනීම
    2. පෘතුගීසි ආණ්ඩුව හා කෝට්ටේ ජනතාව සම්බන්ධ කළ පුරුක වූ ප්‍රභූන් ආගම ට හරවාගෙන දේශපාලන වාසි ලබා ගැනීම
  - ජේසුයිට්, ෆ්‍රැන්සිස්කන්, ඩොමිනිකන් වැනි මිෂනාරී සමාගම් විසින් ආගම් ප්‍රචාරය සිදු කිරීම
  - යාපනය රාජ්‍යයේ ද කතෝලික ධර්මය ව්‍යාප්ත කිරීම
  - ආගම් ප්‍රචාරය සඳහා විවිධ ක්‍රියාමාර්ග යොදා ගැනීම

    අධ්‍යාපනය

    දේශන පැවැත්වීම

    තිළිණ, සම්මාන හා නිලතල ප්‍රදානය කිරීම

    බදුවලින් නිදහස් කිරීම

    අධිකරණ කටයුතුවල දී සහන ලබා දීම

    ආණ්ඩුව අනුමත කළ ආගම් පමණක් ඇදහීමට අවස්ථාව ලබා දීම.
  - මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් ඉතා දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
  - ඇතැම් බෞද්ධ සිද්ධස්ථාන කතෝලික සිද්ධස්ථාන බවට පත් කිරීම.
  - මෙරට පැවති ආගමික සහනශීලීත්වය හා අන්‍යාගම්වලට ගරු කිරීමේ ප්‍රතිපත්තිය බිඳවැටීම.
- ලන්දේසි ආර්ථික ප්‍රතිපත්ති
  - කුරුඳු ඇතු`ළු වැඩි වටිනාකමක් තිබු වෙළෙඳ භාණ්ඩ මෙරටින් ලබාගන්නා අතර වෙළෙඳාමේ අයිතිය ලබාගැනීම ලන්දේසීන්ගේ ප්‍රධාන ආර්ථික අරමුණ වීම.
  - ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් ආර්ථික කටයුතු මෙහෙයවීම
  - දේශීය ඉඩම් භුක්ති ක්‍රමය, කුලක්‍රමය පදනම් කරගත් සමාජ රටාව සහ සාම්ප්‍රදායික චාරිත්‍රවිධි ඇසුරින් අඩු වියදමකින් ලාභ ලැබීම.

- ඇතැම් වෙළෙඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඒකාධිකාරයක් පවත්වාගෙන යාම (කුරුඳු, අලි ඇතුන්වෙළෙඳාම, මැණික් ගැරීම සහ විකිණීම, මුතු විකිණීම)
- ප්‍රධාන ආදායම් උපයන භාණ්ඩයක් ලෙස පුවක් වැදගත් වීම.
- උඩරට රාජ්‍යය සමඟ අභ්‍යන්තර වෙළෙඳාමක් පවත්වාගෙන යාම.
- ලුණු, කරවල වැනි දෑ උඩරටටත් එම ප්‍රදේශයෙන් ගම්මිරිස්, බුලත්, කරාබුනැටි, කරදමුංගු, මී පැණිඇතුළු ද්‍රව්‍ය සමූහයක් වෙරළබඩ ප්‍රදේශවලටත් තවලම් මඟින් ප්‍රවාහණය කිරීම.
- ආනයන, අපනයන වෙළෙඳ රටාවක් පවත්වාගෙන යාම.
- අන්තර් ආසියාතික වෙළෙඳාමට සම්බන්ධ වීම.
- ලන්දේසි ආණ්ඩුවේ වියදම් අඩු කරගැනීමේ අරමුණින් සීමිත වශයෙන් දේශීය කෘෂි අංශය දියුණු කිරීමට විවිධ ක්‍රියාමාර්ග ගැනීම.

  උදාහරණ : මුතුරාජවෙල අස්වැද්දීම<br>
  වැව් රැසක් ප්‍රතිසංස්කරණය කිරීම (යෝධ කණ්ඩිය, කන්තලේ කිරම සහ ඌරුබොක්ක)<br>
  උක් , ඉන්ඩිගෝ, කපු වැනි දෑ වගාකොට සීනි නිපදවීම, රෙදි සායම් කිරීම සහ රෙදි විවීම වැනි කර්මාන්ත පු`ළුල් කිරීම

- බදු අය කිරීම ක්‍රමවත් කිරීමට තෝම්බු සැකසීම.
- බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසි කිරීමේ ක්‍රමය ආරම්භ කිරීම.
- මොරටුවේ වඩු කර්මාන්තය පුළුල් කිරීම.
- උපරිම ලාභ ලැබීමේ අරමුණින් යුද වියදම් අවම කිරීම.

- ලන්දේසි ආගමික ප්‍රතිපත්තිය
  - ප්‍රොතෙස්තන්ත හෙවත් රෙපරමාදු ආගම ව්‍යාප්ත කිරීම.
  - බෞද්ධ, හින්දු හා කතෝලික ජනයා රෙපරමාදු ආගමට හරවා ගැනීමට දේවගැතිවරුන් ක්‍රියා කිරීම.
  - රෙපරමාදු ක්‍රිස්තියානිය වැළඳගන්නා අයට උසස් තාන්න මාන්න තෑගි බෝග හා ප්‍රශංසා ලබා දීම.
  - 'ඉස්කෝල' ආරම්භ කර ඒවා ආගම් ප්‍රචාරයට ඉවහල් කරගැනීම.
  - අන්‍යාගමික ළමයි බෞතීස්මයෙන් පසු පාසල්වලට ඇතුළත් කරගැනීම.
  - යුරෝපීය දරුවන් සඳහා 'කොළඹ සෙමනේරිය' වැනි වෙන ම පාසල් ආරම්භ කිරීම.
  - ගුරුවරුන් පුහුණු කිරීමට කොළඹ නගරයේ 'නෝමල් පාසල' ආරම්භ කිරීම.
  - අධ්‍යාපන කටයුතු මණ්ඩලයක් මඟින් පාලනය වීම.
  - 1739 සිංහල මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දී සිංහලයෙන් බයිබලය මුද්‍රණය කර බෙදා හැරීම.

**7. ක්‍රි.ව.1848 කැරැල්ල, කැරැල්ලට බලපෑ හේතු සටනේ නායකයින් හා එහි ප්‍රතිඵල ඇසුරෙන් විස්තර කරන්න.**

- 1848 නිදහස් සටන
  - 1848 නිදහස් අරගලය බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට එරෙහි ව ආයුධ සන්නද්ධ ව සිදු කළ අවසාන අරගලය වීම.
  - මාතලේ හා කුරුණෑගල ප්‍රබල ලෙස ව්‍යාප්ත වූ මෙය කොළඹ ද සුළු වශයෙන් ඇති වීම.
  - මෙම අරගලය සඳහා බලපෑ හේතු දිගුකාලීන හා ආසන්න ලෙස හඳුනාගත හැකි වීම.
- කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණවල බලපෑම
  - උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම නිසා උඩරට සාම්ප්‍රදායික අනන්‍යතාවට හානි සිදුවීම.
  - සිවිල් සේවකයන්ට වතු වගාවේ නිරත වීමට අවසර දීම නිසා පරිපාලනය බිඳ වැටීම.
  - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම සහ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දීම නිසා සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමයේ වෙනසක් සිදුවීම.
  - ගම්සභාව නොසලකා හැරීම නිසා ගැමි ජනතාවගේ ප්‍රශ්න උග්‍ර වීම
  - නව අධිකරණ ක්‍රමය නිසා ජනතාව ගැටලු රැසකට මුහුණ දීම
  - දේශීය කෘෂිකර්මාන්තය නොසලකා හැරීම
  - 1840 අංක 12 දරන මුඩුබිම් පනත නිසා ගොවියන්ගේ පාරම්පරික ඉඩම් අහිමි වීම
  - යුරෝපීය වැවිලි කරුවන්, දකුණු ඉන්දියානු කම්කරුවන්, පහතරට ව්‍යාපාරිකයන් වැනිආගන්තුක කොටස් උඩරටට සංක්‍රමණය වීම නිසා උඩරට ප්‍රදේශවල සාම්ප්‍රදායික ජනජීවිතයට අහිතකර බලපෑම් ඇති වීම
  - වතු වගාව සඳහා ඉඩම් එළි කිරීම, දේශීය කෘෂිකර්මය හා ජන ජීවිතය බිඳවැටීමට හේතු වීම
  - උඩරට සුරාසැල් විවෘත කිරීම නිසා සමාජයේ දුරාචාර වේගයෙන් පැතිරී යාම
- ආසන්න සාධක
  - ආණ්ඩුවේ ආදායම වැඩිකර ගැනීම සඳහා ටොරිංටන් ආණ්ඩුකාරවරයා නව බදු පැනවීම

    උදාහරණ: සාප්පු බද්ද, කරත්ත බද්ද, ඔරු බද්ද, තොටුපල බද්ද, තුවක්කු බද්ද, ඇඟ බද්ද,මුද්දර බද්ද, සුනඛ බද්ද
  - රජය හා ආගම අතර පැවති සාම්ප්‍රදායික සමීප සබඳතාව බිඳ දමමින් දළදා වහන්සේගේ ආරක්ෂාව භික්ෂූන් වහන්සේට හා දියවඩන නිලමේට පැවරීම
  - උඩරට ඉඩම් විදේශිකයන්ට විකිණීම හේතු කොටගෙන උඩරැටියන් තුළ අවිශ්වාසයන් ඇති වීම
- සටනේ ආරම්භය හා ව්‍යාප්තිය
  - ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තියට විරෝධය දැක්වීමට මහජනතාව ඒකරාශි වීම.

- කොළඹ, වාරියපොළ, කුරුණෑගල වැනි ප්‍රදේශවලට විරෝධතා පැතිරීම.
- බදුල්ලට රැස් වූ ඇතැම් ගොවීන් තුවක්කු බද්දට විරෝධය දක්වා ඒජන්තවරයා ඉදිරියේ ම තුවක්කු පොළොවේ ගසා කඩා දැමීම.
- මාතලේ, වාරියපොළ, කුරුණෑගල වැනි ප්‍රදේශවල ජනයා ආයුධ සන්නද්ධ ව රජයේ ගොඩනැඟිලි හා උසාවි ආදියට පහර දීම.
- 1848 සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස මාතලේ වැදගත් වීම.
- බ්‍රිතාන්‍ය පාලනයෙන් පීඩාවට පත් සාමාන්‍ය ජනයා අතරින් ගොංගාලේගොඩ බණ්ඩා, පුරන් අප්පු, ඩිංගිරාල, දීනිස් වැනි නායකයන් ඉස්මතු වීම.
- බදු විරෝධී අරගලයක් ලෙස ආරම්භ වී ඉංග්‍රීසි පාලකයන් පලවා හැරීමේ එළවා දැමීමේ මූලික අරමුණ ලෙසින් සටන ක්‍රියාත්මක වීම.

- 1848 නිදහස් සටනේ ප්‍රතිඵල
  - ජනතා අපේක්ෂා සුන් කරමින් ඉංග්‍රීසින් දරුණු ලෙස කැරැල්ල මර්දනය කිරීම
  - සටනේ නායකයන් ඉංග්‍රීසින්ගේ අත්අඩංගුවට ගෙන දරුණු දඬුවම් නියම කිරීම
  - කඩහපොල හිමි වෙඩි තබා මරා දැමීම
  - ගොංගාලේගොඩ බණ්ඩාට එරෙහි ව නඩු අසා කසපහර දී රටින් පිටුවහල් කිරීම
  - පුරන් අප්පුට මරණීය දණ්ඩනය නියම කිරීම
  - සටන අවස්ථාවේ එවකට සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකරු වූ ටොරිංටන් සහ රාජ්‍ය ලේකම් ටෙනන්ට් එංගලන්තයට කැඳවීම.
  - සටනට හේතු සොයා බැලීමට පත් කළ කමිටුවේ නිර්දේශ අනුව ඇතැම් අලුත් බදු අහෝසි කිරීම හා ඇතැම් ඒවා සංශෝධනය කිරීම.
  - 1850න් පසු බලයට පත් ඇතැම් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් ගොවි ජනයා කෙරෙහි සැලකිලිමත් වී කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීමට ක්‍රියා කිරීම.
  - සටන පරාජය වීම නිසා බ්‍රිතාන්‍ය බලය තව දුරටත් තහවුරු වීම.

8. **ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ඉතිහාසයේ සුවිශේෂී අවස්ථාවක් ලෙස ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වා දිය හැකිය.**

   i. **ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන් අවදියේ මෙරට බ්‍රිතාන්‍ය ආණුඩුකාර ධූරය දරන ලද්දේ කවුරුන් ද?**
   **හර්බට් ස්ටැන්ලි** **( ලකුණු 01යි)**

   ii. **ඩොනමෝර් කොමිසමේ සාමාජිකයන් දෙදෙනෙකු නම් කරන්න.** **( ලකුණු 02යි)**
   ඩොනමෝර් සාමි, ජෙෆ්රි බට්ලර්, මැතිව් නාදන් සහ ඩ්‍රමන්ඩ් ෂීල්ඩ්

   iii. **ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හඳුන්වා දීමට පෙර පැවති මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමයේ පැවති ලක්ෂණ විස්තර කරන්න.** **( ලකුණු 04යි)**
   - ලංකා ජාතික සංගමයේ ඉල්ලීම් මත 1924 දී නව ප්‍රතිසංස්කරණ ඇති කිරීම.
   - ව්‍යවස්ථාදායකයේ සාමාජික සංඛ්‍යාව 49 තෙක් ඉහළ යාම.
   - ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් මහජන ඡන්දයෙන් තෝරාපත්කොට ගැනීම.

   iv. **ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපීපෙනෙන ලක්ෂණ විස්තර කරන්න.** **( ලකුණු 09යි)**
   - මැනිං ආණ්ඩුක්‍රම බලය හා වගකීම් බෙදී පැවතුණු දුර්වල ආණ්ඩුක්‍රමයක් වූ බැවින් ඊට එරෙහි ව ඇති වූ උද්ඝෝෂණ ව්‍යාපාරවල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවට සුදුසු ආණ්ඩුක්‍රමයක් යෝජනා කිරීම සඳහා ලංකාවට පැමිණීම.
   - ඩොනමෝර් කොමිසම - ඩොනමෝර් සාමි, ජෙෆ්රි බට්ලර්, මැතිව් නාදන් සහ ඩ්‍රමන්ඩ් ෂීල්ඩ් යන අයගෙන් සමන්විත වීම

   - ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ
     - රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.
     - විධායක කාරක සභා ක්‍රමය ආරම්භ කිරීම.
     - ආණ්ඩුකාරයාගේ බලතල අඩු කිරීම.
     - රාජ්‍ය නිලධාරීහු තිදෙනා.
     - ජනවාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම.
     - සර්වජන ඡන්ද බලය ලබාදීම.
     - පළාත්බද නියෝජන ක්‍රමය පුළුල් කිරීම.
   - රාජ්‍ය මන්ත්‍රණ සභාව
     - ව්‍යවස්ථාදායක හා විධායක සභා වශයෙන් වෙන් වෙන් ව පැවති ආයතන දෙක විසුරුවා හැර ඒ වෙනුවට රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.
     - සාමාජික සංඛ්‍යාව 61කි.
     - ප්‍රදේශීය ඡන්ද කොට්ඨාස පදනම් කරගෙන ජනතා ඡන්දයෙන් - 50
     - ආණ්ඩුකාරයා විසින් නාමකරණයෙන් - 08

- නිලබලයෙන් - 03
- සභාවේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් තෝරාගත් කථානායකවරයා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මූලාසනය ගැනීම.

- රාජ්‍ය මන්ත්‍රණ සභාවේ බලතල හා කාර්ය
- නීති පැනවීමේ බලය
- වාර්ෂික අයවැය ලේඛනය සැකසීම.
- විධායකයට යෝජනා ඉදිරිපත් කිරීම.
- විධායක කාරක සභා පරීක්ෂා කිරීම.

- විධායක කාරක සභා
- ස්වදේශ කටයුතු පිළිබඳ කාරක සභාව.
- කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ කාරක සභාව.
- පළාත් පාලනය පිළිබඳ කාරක සභාව.
- සෞඛ්‍යය පිළිබඳ කාරක සභාව.
- අධ්‍යාපනය පිළිබඳ කාරක සභාව.
- කම්කරු, කර්මාන්ත හා වාණිජ කාරක සභාව
- පණිවිඩ හුවමාරුව හා පොදුවැඩ කාරක සභාව
- රාජ්‍ය නිලධාරීන් තිදෙනා සහ කථානායකවරයා හැර ඉතිරි 57 දෙනා කාරක සභා 7ක් බෙදා වෙන් කිරීම
- කාරක සභාවල සාමාජික සංඛ්‍යාව උපරිමය 9ක් සහ අවමය 6ක් වීම
- කාරක සභාවේ වැඩි දෙනාගේ කැමැත්තෙන් එහි සභාපතිවරයා තෝරාපත් කොට ගන්නා ලද අතර ඔහු එම කාරක සභාවේ විෂය භාර ඇමතිවරයා වීම
- විධායක කාරක සභා සභාපතිවරුන් 7 දෙනාගෙන් සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙන් අමාත්‍ය මණ්ඩලය සමන්විත වීම

- ආණ්ඩුකාරවරයා
- රජු හෝ රැජනගේ නියෝජිත වීම
- ආරක්ෂක කටයුතු
- විදේශ කටයුතු
- ආගමන කටයුතු
- නැව් ගමනාගමන කටයුතු
- වෙළෙඳ ගිවිසුම් හා සම්බන්ධ කටයුතු
- මුදල් හා සේවා කටයුතු
- අධිකරණ කටයුතු - ආණ්ඩුකාරයා සතු වීම
- මේ කටයුතු සම්බන්ධයෙන් ආණ්ඩුකාරයා යටත් විජිත භාර ලේකම් වෙත ඍජු ව වගකිව යුතු වීම

- රාජ්‍ය නිලධාරීහු
- මහ ලේකම්
- මුදල් ලේකම්
- නීති ලේකම්

- මහ ලේකම්
- ආරක්ෂක, විදේශ කටයුතු සහ රාජ්‍ය සේවය පාලනය කිරීම

- මුදල් ලේකම්
- වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීම
- රජයේ ආදායම් එකතු කිරීම හා බෙදා හැරීම
- විදේශ ණය ගනුදෙනු පාලනය
- මුදල් ප්‍රතිපත්තිය
- රාජ්‍ය භාණ්ඩාගාරයේ භාරකාරත්වය

- නීති ලේකම්
- රාජ්‍ය මන්ත්‍රණ සභාව සම්මත කරන සෑම පනත් කෙටුම් පතක් පිළිබඳ ව ම වාර්තා රාජ්‍ය ලේකම් වෙත යැවීම
- අධිකරණ කටයුතු පාලනය කිරීම
- ආණ්ඩුවට නීති උපදෙස් දීම
- රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ පැවැත්වීම

- සර්වජන ඡන්ද බලය
- සර්වජන ඡන්ද බලය යනු අවුරුදු 21 ට වැඩි සියලු දෙනාටම ඡන්ද බලය හිමි වීමයි.
- ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ සර්වජන ඡන්ද බලය හිමි වීම.

- වාර්ගික නියෝජනය අහෝසි කිරීම.
- බ්‍රිතාන්‍ය යටත් විජිත අතුරෙන් ඡන්ද බලය හිමි වූ ප්‍රථම ආසියාතික රට ශ්‍රී ලංකාව වීම.
- දේශපාලන කටයුතුවලට සහභාගි වීමට ජනතාවට අවස්ථාව උදා වීම.
- ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නංවන විට ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයක් හරිහැටි වර්ධනය වී නොතිබුණ අතර ක්‍රමයෙන් දේශපාලන සංවිධාන බිහි වීම.
- සුභසාධන රාජ්‍ය ප්‍රතිපත්තියක් ආරම්භ වීම.

- ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ දුර්වලතා

- ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමේ දී ප්‍රායෝගික දුර්වලතා පැවති බවට අදහස් ප්‍රකාශ වීම.
- ආණ්ඩුකාරයා සහ රාජ්‍ය නිලධාරීන් වෙත රජයේ බලතල මෙන් ම වැදගත් අමාත්‍යාංශ පැවරී තිබීම පිළිබඳ ව ලාංකිකයන් තුළ අප්‍රසාදයක් ඇති වීම.
- කාරක සභා ක්‍රමය පාලන කටයුතු ප්‍රමාද වීමට හේතු වූ බවට චෝදනා එල්ල වීම.
- අනාගත පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය පිළිබඳ ව ආකල්පය වර්ධනය වීමට බාධා ඇති වීම.
- ආණ්ඩුකාරයාගේ බලතල සීමා කරන ලෙසත් වැදගත් ම අමාත්‍යාංශ තුන දේශීය ඇමතිවරුන් වෙත පවරන ලෙසත් ඉල්ලමින් ලාංකිකයන් දිගින් දිගට ම උද්ඝෝෂණ කිරීම.

**9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

(i) මහනුවර යුගයේ සමාජ සංවිධානය

- රජු රටේ සියලු ඉඩම්වල උරුමකරු ලෙස පිළිගැනීම.
- අයිතිය හා භුක්තිය පදනම් කරගෙන රටේ මු`ළ ඉඩම් ප්‍රමාණය ගබඩාගම්, නින්දගම්, විහාරගම්, දේවාලගම්, පරවේණි ගම් ලෙස කොටස් කීපයකට බෙදී පැවතීම.
- රටවැසියා භුක්ති විඳි ඉඩම් වෙනුවෙන් කිසියම් සේවාවක් හෝ භාණ්ඩ ප්‍රමාණයක් හෝ ලබා දීම.
- පවුල සමාජයේ ප්‍රධානතම ඒකකය වීම.
- කුල ක්‍රමය අනුව පදනම් වූ ග්‍රාමීය ස්වයංපෝෂිත සමාජයක් පැවතීම.
- ඒ ඒ කුලයන්ට වෙන් වූ ආර්ථික කටයුතු දක්නට ලැබීම.
- ආවාහ විවාහ කටයුතු සමාන කුලයන් අතර පමණක් සිදු වීම.
- දීග විවාහය, බින්න විවාහය හා එකගෙයි කෑම ලෙස විවාහය ක්‍රම තුනකට ක්‍රියාත්මක වීම.
- ගොවිතැන් කටයුතු ප්‍රධාන කොටගත් එකිනෙකාගේ වැඩ කටයුතු ගමේ සියලු දෙනාගේ සහයෝගයෙන් සිදු කිරීම - අත්තම් ක්‍රමය

(ii) ලංකා ජාතික සංගමය

- 1919 වර්ෂයේ ආරම්භ විය.
- ප්‍රථම සභාපතිවරයා පොන්නම් අරුණාචලම් විය.
- 1915 වර්ෂයේ සිංහල මුස්ලිම් කෝලාහලය අවස්ථාවේ ඉංග්‍රීසි ආණ්ඩුව ක්‍රියාත්මක කළ මර්දනයට ශක්තිමත්ව මුහුණ දීමට අවශ්‍ය පසුබිමක් හෝ සංවිධාන ශක්තියක් ශ්‍රී ලාංකිකයන්ට නොවීය. ඉදිරියටත් එවැනි අභියෝගවලට මුහුණ දීම සඳහා ශක්තිමත් සංවිධානයක් අවශ්‍ය විය. එසේම ව්‍යවස්ථාදායක සභාව තුළ ලාංකිකයන්ට වැඩි බලයක් ලබා ගැනීම සඳහා ප්‍රබල බලපෑමක් කිරීමට ද සංවිධානාත්මක යාන්ත්‍රණයක් අවශ්‍ය විය. මෙසේ ගොඩ නගනු ලබන සංවිධානය සිංහල, දෙමළ, මුස්ලිම් යන ජාතීන්ගේ එකතුවෙන් ගොඩනැගීමද අවශ්‍ය කරුණක් විය. මෙමගින් රටේ උගත් මධ්‍යම පංතිය දේශපාලනිකව සංවිධානය කිරීම ද අවශ්‍ය විය. මෙවැනි අරමුණු රැසක් මූලික කරගනිමින් ලංකා ජාතික සංගමය ආරම්භ විය.
- දේශීය සියලු ජනවර්ගයන් නියෝජනය කරන නායකයින් මෙයට සම්බන්ධ වීම ජාතික සමගිය ගොඩනැගීමට ද යම් බලපෑමක් මේ ඔස්සේ ලැබුණි. ලංකා ජාතික සංගමය බිහිවීමට පෙර පැවති හලාවත සංගමය, යාපනය සංගමය වැනි සංගම් රැසක් ද මේ සමග ඒකාබද්ධ විය. ආරම්භක නායකයින් ලෙස ඩී.බී. ජයතිලක, ඩී.එස්. සේනානායක, පොන්නම්බලම් රාමනාදන් වැනි අය දැක්විය හැකිය. මොවුන් ඉල්ලීම් දිනා ගැනීම සඳහා ප්‍රචණ්ඩකාරී ක්‍රියා මාර්ගවලට වඩා ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම භාවිත කළහ.
- පසුකාලීනව ඇතැම් දේශපාලනික කාරණා මත නායකයින් අතර මතභේද ඇති විය. එවැනි එක් අවස්ථාවක 1921දී පොන්නම්බලම් අරුණාචලම් මහතා සංගමයෙන් ඉවත් විය. ඒ සමගම ජාතික සංගමය දුර්වල වන්නට විය. සංගමයට සම්බන්ධව සිටි නායකයින් විවිධ දේශපාලන පක්ෂ බිහි කිරීම, සංගමයෙන් ඇතැම් නායකයින් ඉවත් වීම වැනි කාරණා මත ලංකා ජාතික සංගමය දුර්වල වී අක්‍රිය තත්වයට පත් විය.

(iii) බ්‍රිතාන්‍ය වෙළඳ සමාගම යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ පාලනය

- මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම යටතේ පාලනය වීම.

- ඉංග්‍රීසි වෙළෙඳ සමාගම මඟින් ඉන්දියාවේ මදුරාසි ආණ්ඩුව ක්‍රියාත්මක කළ පාලන ක්‍රමය හා එහි නිලධාරීන් ලංකාවේ මුහුදුබඩ පාලනයට යෙදවීම.
- 1796 සිට 1798 තෙක් මදුරාසි පාලනය ක්‍රියාත්මක වීම.

- මදුරාසි පාලනය යටතේ රෙසිඩන්ට්වරයකු විසින් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම.
- රෙසිඩන්ට්වරයා යටතේ කච්චේරි පිහිටුවා ඒවා සඳහා ආදායම් එකතු කිරීමට කලෙක්ටර්වරු පත් කිරීම.
- කලෙක්ටර්වරුන්ගේ සහයට මදුරාසියෙන් ගෙන්වූ අවුමිල්දාර් ඇතුළු නිලධාරීන් පත් කිරීම.
- වෙළෙඳ සමාගම තම වියදම් පියවා ගැනීමේ අරමුණෙන් නව බදු රැසක් පැනවීම (පොල් බද්ද,ලුණු බද්ද, මාළු බද්ද, දුම්කොළ බද්ද, අරක්කු සහ රා බද්ද)
- මෙම නව නිලධාරී ව්‍යුහයත්, නව බදු ක්‍රමයත් ජනතාවට ඉතා පීඩාකාරී වීම.
- 1797 - 1798 වෙළෙඳ සමාගමට විරුද්ධ ව කැරැල්ලක් පැනනැඟීම.
- කැරැල්ල මැඩ පවත්වා කැරැල්ලට හේතු සොයාබැලීමට පත් කළ මියුරන් කොමිසම මඟින් යෝජනා රැසක් ඉදිරිපත් කිරීම.

- ද්විත්ව පාලන ක්‍රමය
- 1798 මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම සඳහා ආණ්ඩුකාරවරයකු පත් කිරීම.
- ප්‍රෙඩ්රික් නෝර්ත් පළමු වැනි ආණ්ඩුකාරවරයා වීම.
- පරිපාලන කටයුතුවලට බ්‍රිතාන්‍ය රජය සම්බන්ධ වීම
- වෙළෙඳ හා වාණිජ කටයුතු පාලනය කිරීමේ බලය වෙළෙඳ සමාගමට ලබා දීම මෙලෙස හවුලේ ගෙනගිය පාලනය ද්විත්ව පාලනය ලෙස හඳුන්වනු ලැබේ.මෙම පාලන ක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය රජයට මෙන් ම වෙළෙඳ සමාගමට ද වගකිවයුතු වීම.
- තීරණ ගැනීමේ දී වෙළෙඳ සමාගම සහ ආණ්ඩුකාරවරයා අතර මතභේද ඇති වීම නිසා ද්විත්ව පාලන ක්‍රමය අසාර්ථක විම.

(iv) මහවැලි සංවර්ධන යෝජනාක්‍රමය
- මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියර පොල්ගොල්ලේ දී මහවැලි ගඟ හරහා විශාල බැම්මක් තනවා රජරට වියළි කලාපයට ජලය ගෙනයාම.
- ඉතිරි අදියර සම්පූර්ණ කිරීම වසර 30කින් සිදු කිරීමට යෝජනා කිරීම.
- 1977 බලයට පත් ජේ.ආර්. ජයවර්ධන රජය විසින් එය වසර පහකින් නිම කිරීමට යෝජනා කිරීම.
- 1978 මහවැලි සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීම හා 1979 මහවැලි අධිකාරිය පිහිටුවීම.
- මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉදි කළ ජලාශ කොත්මලේ, වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ, උල්හිටිය, රත්කිඳ හා මාදුරු ඔය.